" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
## OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLSI · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01(A)-2019 · ඔබේ අංකය / உமது இலக்கம் / Your No. · දිනය / திகதி / Date 2020-01-08

**පළාත් චක්‍රලේඛ : 01/2020**

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II හා I ශ්‍රේණිවලට 2013.04.02 දින සිට උසස් කිරීම්/ උසස් කිරීම් පෙරදාතම් කිරීම මත වැටුප් වර්ධකයක් අඩුවීම සම්බන්ධයෙන් සහන සැලසීම</u>**

අංක 1898/5 දරණ 2015.01.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද බස්නාහිර පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථාව අනුව 2013.04.02 දින සිට ක්‍රියාත්මක වීම මත, 2005.03.23 දිනැති අංක 1385/10 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද බස්නාහිර පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථාව අනුව 2013.04.02 දිනට පසු දිනක සිට බස්නාහිර පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II හෝ I ශ්‍රේණියට ලබා දී ඇති උසස්වීම, 2013.04.02 දිනට ලැබීම මත වැටුප් වර්ධක අඩුවීම සම්බන්ධයෙන් සිදුව ඇති වැටුප් විෂමතාව නිවැරදි කරන ලෙසට නියෝජනයන් ඉදිරිපත් වී ඇත.

02. ඉහත පරිදි සිදුව ඇති වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි ක්‍රියා කරන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019.10.18 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි අංක 04/2019 මඟින් දන්වා ඇත. එය පහත පරිදි බස්නාහිර පළාත් සභාවට අදාල කර ගනී.

> අංක 1898/5 දරණ 2015.01.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද බස්නාහිර පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථාව 2013.04.02 දින සිට ක්‍රියාත්මක වීම මත එකී සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව 2013.04.02 දිනට බස්නාහිර පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II හෝ I ශ්‍රේණියට උසස්වීම් ලැබූ නිලධරයන්ගේ එම උසස්වීම, **වැටුප් සැකසීමේ කාර්යය සඳහා පමණක්** 2013.04.02 දිනට පසුව එළඹුණු පෙර ශ්‍රේණියේ/කලින් ලද උසස්වීමට අදාළ වැටුප් වර්ධක දිනයේ සිදු වූවා සේ සලකා වැටුප් පරිවර්තනය සිදු කළ යුතුය.

03. ඉහත 02 ඡේදයේ පරිදි වැටුප් පරිවර්තනය සිදු කළ පසු ඉදිරි වැටුප් වර්ධක දිනය ලෙස නිලධරයාගේ සත්‍ය උසස්වීම් දිනට සැලකිය යුතුය.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.



| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதிப் பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මූල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |